# ආදිවාසීන්

## ලෝකයේ ආදිවාසීහු කවරහු ද?

ලොව හැමතැනම ජනතාවට ඔවුන්ගේ මේසය මත ඇති ආහාර, ඔවුන්ගේ භාෂාවේ වචන, හිසරුදාවේ සිට හෘද රෝග දක්වා රෝග සඳහා පාවිච්චි කරන බෙහෙත් වර්ග ආදිය මගින් ආදිවාසීන්ගේ සංස්කෘතියේ හා ඔවුන්ගේ ජයග්‍රහණවල බලපෑම හා ආශ්වාදය ලැබෙන බව බොහෝ විට අපි නොදනිමු.

අර්තාපල්, ගම්මිරිස්, තක්කාලි, උක්, සුදුළූණු, රනිල බෝග, ධාන්‍ය වර්ග ආදී ලෝකයේ ප්‍රධානතම ආහාර වර්ග වලින් බොහොමයක් ප්‍රථමයෙන් වගා කරන ලද්දේ ආදිවාසීන් විසිනි. ඇමරිකාවේ ස්වදේශිකයන්ගේ භාෂා වලින් වත්මන් ව්‍යවහාරයට වචන රැසක් එක් වී තිබේ. පැලෑටි යොදා ගෙන නිපදවනු ලබන ඇස්ප්‍රින්, ක්විනින්, ඩිවිටලිස් වැනි බෙහෙත් වර්ග ඇතුළු එවැනි බෙහෙත්වලින් 75%-ක්ම ලබා ගැනෙන්නේ ගෝත්‍රික ජනතාව වාසය කරන ප්‍රදේශවල වැවෙන බෙහෙත් පැලෑටිවලිනි. නූතන සභ්‍යත්වයට ආදිවාසීන්ගේ දායකත්වය අතිවිශාලය.

බොහෝ රටවල ආදිවාසීහු මුල් පදිංචිකරුවන්ගෙන් පැවත එන්නන් වෙති. ඔවුන්ගේ සංස්කෘතිය ආගම් සහ සාමාජීය හා ආර්ථික සංවිධාන විවිධාකාරය. භාෂා හා සංස්කෘතික වෙනස්කම් සහ භූගෝලීය වෙනස්වීම් අනුව එකිනෙකට වෙනස් ආදිවාසී ජන කොටස් පන්දහසක් පමණ පෙන්නුම් කළ හැකි ය. ඇතැම්හු දඩයක්කාරයෝ ය. තවත් අය නගරවල දිවි ගෙවමින් ස්වකීය ජාතික, සමාජයේ සංස්කෘතියට පූර්ණ වශයෙන් සහභාගි වෙති.

සියලු ආදිවාසීහු තමන්ට උරුම වූ සංස්කෘති පිළිබඳ දෘඪ හැඟීමකින් යුතුව සිටිති. ඔවුන්ගේ එම සංස්කෘතියේ ප්‍රබල අංගයක් වන්නේ ඉඩම හා බැඳුණු විශේෂ සබඳතාවයි.

**ආදිවාසීහු කොපමණ සිටින් ද? ඔවුන්ගේ වාසභූමි මොනවා ද?**

ලෝකයේ රටවල් හැත්තෑවකට වැඩි සංඛ්‍යාවක තිස්කෝටියක් ආදිවාසීන් වාසය කරන බව ගණන් බලා තිබේ. ඇමරිකානු මහාද්වීපයේ රතු ඉන්දියානුවන්, පරිධ්‍රුවන කලාපයේ ඉන්යුට් හා ඇලූටියන්ස් උතුරුයුරෝපයේ සාමි, ඕස්ට්‍රේලියාවේ ඇබෝරිජින්ස් හා ටොරේස්, ස්ට්‍රෙස් දූපවත්වාසීන්, නවසීලන්තයේ මාඕරි ඒ අතර වෙති. බොලිවියාවේ ජනගහණයෙන් 60% කට වැඩි සංඛ්‍යාවක් ද ගෝතමාලාවේ හා පේරු රාජ්‍යවල ජනගහණයෙන් අඩක් ද ආදිවාසීන් ය. ඉන්දියාවේ හා චීනයේ වාසය කරන ආදිවාසීන් හා ගෝත්‍රිකයන් සංඛ්‍යාව පහළොස්කෝටිය ඉක්ම වයි. මියන්මාර් හි ආදිවාසීන් සංඛ්‍යාව කෝටියකට වැඩිය.

**ආදිවාසීන්ගේ ජීවන තත්ත්වය**

විවිධත්වයක් තිබුණ ද ඔවුහු සමාන ගැටළුවලට මුහුණ පා සිටිති. යටත් විජිත වාදයේ නැගීම සමග ම ආදිවාසීන්ට සීමා නොවූ ආගම් ව්‍යාප්තිය, සංවර්ධනයේ හා නවීකරණයේ අනුකම්පා විරහිත පියවර, නිසා තම සම්ප්‍රදායික සංස්කෘති සෝදාපාලුව ටත් ඔවුන්ට හිමිව තිබූ ඉඩම් ආර්ථික බලයේ කොටසක් ලෙස රාජසන්තක කිරීම හෝ අයිතිය උදුරා ගැනීමකට ගොදුරුවීමකට ආදිවාසීන්ට සිදුවිය. මේ මිහිතලය මත වෙසෙන වඩාත්ම පසුගාමී හා වරප්‍රසාද අහිමි අසරණම පිරිස බවට ආදිවාසීන් පත් කෙරුණේ එමගිනි.



ඉන්දියාවේ ගෝත්‍රිකයන්ගෙන් බහුතරය ජීවත් වන්නේ දරිද්‍රතා මට්ටමින් ද පහළ තත්ත්වයකයි. උතුරු රුසියාවේ ආදිවාසීන්ගේ ආයුකාලය ජාතික සාමාන්‍යයට වඩා වසර 18 කින් අඩුය. ඔස්ට්‍රේලියාවේ ඇබෝරිජින්ස්වරුන් අතර විරැකියා මට්ටම ජාතික සාමාන්‍යයට වඩා පස් ගුණයකින් වැඩි ය.

බොහෝවිට ජාතික සමාජයට අනුගත වූ ආදිවාසීන්ට නිවාස, අධ්‍යාපනය භාෂා හා ආගම් වලට සම්බන්ධ කරුණුවලට භේද සලකා අසාධාරණයකට හා සූරාකෑමකට ගොදුරුවීමට සිදු වී තිබේ. ආදිවාසීන් සතු ඉඩකඩම් හා ස්වාභාවික සම්පත්, ජාතික සංවර්ධනය සඳහා යොදා ගැනීමේ දී ඔවුහු බලහත්කාරයෙන් අවතැන් කිරීමට ලක්වෙති. ඔවුන්ගේ සංස්කෘතියට බාධා සිදුවෙයි. ඇතැම් ආදිවාසීන් වඳවී යාමේ තර්ජනයකට ලක්ව ජීවත් වන බව ද ප්‍රකාශ කිරීම අතිශයෝක්තියක් නොවේ.

**ආදිවාසීන්ගේ සමාජයීය තත්ත්වය**

ගතවූ දශක හතරක පමණ කාලය තුළ මානව අයිතීන් පිළිබඳ දැනුම වර්ධනය වූවද ආදිවාසී කණ්ඩායම්වල අයිතිවාසිකම් පුළුල් කිරීමේ ප්‍රගතියක් සමාන්තරව සිදු වී නැත. ඉන්දියානුවන්, ගෝත්‍රික හා ඇබෝරිජිනල් කණ්ඩායම් ගත වූ දශක දෙකක පමණ කාලය තුළ අනුගමනය කළ ක්‍රියා කලාපය නිසා වෙනස් ආකල්පයක් ගොඩ නැගෙන ලකුණු පහළ වී ඇත.

1979 දී ඩෙන්මාර්ක් පාර්ලිමේන්තුව ග්‍රීන්ලන්තයට ස්වයං පාලනය ලබාදුන් අතර, අධ්‍යාපනය, සෞඛ්‍ය සංරක්ෂණය, සමාජ සුබසාධනය හා ආර්ථික සංවර්ධන පිළිබඳ අධිකරණ බලය ද පිරිනැමිණ.

ආදිවාසීන්ගේ අයිතිවාසිකම් පිළිබඳව පුළුල් බලපෑමකින් යුත් නීතිරීති ආර්ජන්ටිනාව බොලීවියාව, මැක්සිකෝව සහ කොලොම්බියාව යන රටවල සම්මත කොට තිබේ.

ස්වයං පාලනය පිළිබඳ ගැටළු ඇතුළු ආරාවුල් ගණනාවක් නිරාකරණය කර ගැනීම සඳහා නවසීලන්ත රජය සහ ජාතික මාවෝරි කොන්ග්‍රසය ඵලදායි සංවාදයක යෙදී සිටී.

මොහාක් ත්‍රී සහ ඉන්යුට් ඇතුළු කැනඩාවේ ආදිවාසීන් දස ලක්ෂයක් තම දෘෂ්ඨිය පුළුල් කරගනිමින් කලින් සිතා ගැනීමටවත් නොහැකි තරම් වූ දේශපාලන බලයක් ලබාගෙන ස්වකීය ඉඩම් ආරක්ෂා කර ගැනීමටත්, නව සාමාජික හා ආර්ථික වාසි ලබා ගැනීමටත් තම බලය යොදවති. මෙවැනි ජයග්‍රහණ ලබාගෙන ඇතත්, දේශපාලන හා සංවිධාන වශයෙන් දක්ෂතා පෙන්නුම් කළත්, තවමත් ආදිවාසීන්ට දිගටම සිය ඉඩම්, සම්පත් හා අනන්‍යතා අහිමි වෙමින් පවති.



*වැදි ගෝත්‍රිකයෙක්· චිත්‍ර ශිල්පී ජී. ඇස්. ප්‍රනාන්දු මහතාගේ චිත්‍රයක් ඇසුරිණි.*

**ආදිවාසීන් සැළකිල්ල දක්වන්නේ කුමක් කෙරෙහි ද ?**

* ඉඩම් හා සම්පත්
* මානව අයිතීන්
* අභ්‍යන්තර ජනාවාසීකරණය
* ස්වයං පාලනය
* ස්වකීය සංවර්ධනය
* පරිසරය
* අසාධාරණකම් හා වෙනස්කම්
* සෞඛ්‍යය
* අධ්‍යාපනය
* භාෂාව
* සංස්කෘතික පැවැත්ම
* බුද්ධිමය දේපල අයිතීන්
* සාමාජීය හා ආර්ථික තත්ත්ව



තමන් වාසය කරන භූමි ප්‍රදේශවල සහ ස්වභාවික සම්පත්වල නීත්‍යානුකූල හිමිකරුවන් තමන් බව ප්‍රකාශ කරන ආදිවාසීහු එම ප්‍රදේශවල ආර්ථික, සාමාජයීය සැලසුම්කරණය, ඉඩම් පරිහරණය සහ තම පැවැත්මට අවශ්‍ය පදූකරණය පිළිබඳ පාලනය තමන්ට අයිති බව සලකති. එනිසා පූර්ණ ස්වයං පාලනයක් ඔවුහු බලාපොරොත්තු වෙති.

ආදිවාසී ජනතාව විසින් සොයා ගන්නා ලද හා වගා කොට ඒ පිළිබඳ දැනුම පරපුරෙන් පරපුරට දායාද කරන ලද බෙහෙත් පැලෑටිවලින් ලබා ගන්නා ඖෂධවල වාර්ෂික වෙළෙඳපොළ වටිනාකම ඩොලර් කෝටි 4300 ඉක්මවයි. ඖෂධ සමාගම් මේ දේශීය වෛද්‍ය දැනුම උකහා ගන්නා නමුත් ආදිවාසීන් සමග ලාභය බෙදාගන්නේ කලාතුරකිනි.
එහෙයින් ආදිවාසීහු තම බුද්ධිමය දේපල සඳහා වැඩි ආරක්ෂාවක් ලබා ගැනීමට උත්සාහ දරති.

ආදිවාසීන්ගේ කලා නිර්මාණ උසස් තත්ත්වයක පවතී. සංස්කෘතික ආභාෂය මුල්කරගෙන කලා කෘති නිෂ්පාදනය කෙරේ. මේවාට ඉල්ලුම වැඩිය. එහෙත් සොරා ගෙන සහ අවසර නොමැතිව ආදිවාසීන්ගේ නිර්මාණ අලෙවි කිරීම ඔවුන්ගේ මුදල් හා සංස්කෘතික උරුමයන් පැහැර ගැනීමකි. මේනිසා ස්වකීය සංස්කෘතික දේපල සඳහා අයිතිය ලබා ගැනීමට ආදිවාසීහු උත්සුක වෙති.

තමනට උරුම වූ සංස්කෘතිය රැක ගනිමින් පවත්වා ගෙන යාමටත්, සංස්කෘතික උරුමය පරපුරෙන් පරපුරට උරුම කොට දීමටත්, ඔවුහු අපේක්ෂා කරති. එනිසා තම භාෂාවලින් තම ළමුන්ට ඉගැන්වීමේ අයිතිය ඉල්ලා සිටින ඔවුහු ඒ සඳහා ඔවුනට වෙන් වූ පාඩම් පොත්, පාසල් හා උපකරණ අවශ්‍ය බව පවසති.

### සිය අභිමතාර්ථ ඉටු කර ගැනීමට ආදිවාසීහු කුමක් කරත් ද?

තමන්ට සාධාරණය ඉෂ්ඨ කරන ලෙස වසර ගණනාවක සිට ආදිවාසීහු අන්තර් ජාතික ප්‍රජාව ගෙන් ඉල්ලා සිටිති. ජාතික හා කලාපීය මට්ටමින් සංවර්ධනය වී සිටින ඔවුහු ස්වකීය සංස්කෘතිවලට ගරු කිරීමේ තත්ත්වය සහ තමන්ට බලපාන තීරණ ගැනීමේ ක්‍රියාවලියට පූර්ණ සහභාගිත්වය ලබා ගැනීමේ අපේක්ෂාවෙන් අන්තර් ජාතික රාජ්‍ය තාන්ත්‍රික කරලියේ ඉතා ක්‍රියාශීලීව සිටිති.

ආදිවාසීන්ගේ සංවිධාන 10 කට එක්සත් ජාතීන් ගේ ආර්ථික හා සමාජයීය මණ්ඩලයේ උපදේශක තත්ත්වය හිමි වේ.

සාධාරණය ඉටු කර ගැනීම සඳහා නීති පද්ධතියට යොමු වීමට ද ආදිවාසී ප්‍රජාවෝ පෙළඹී සිටිති. එක්සත් ජනපදයේ නිල අනුමැතියකින් තොරව ඉන්දියානුවන්ගෙන් ඉඩම් මිල දී ගැනීම හෝ ලබා ගැනීම තහනම් කෙරෙමින් 1970 දී සම්මත කරගත් පනතක් උල්ලංඝනය කිරීමට විරුද්ධව පැවරූ නඩුවකින් මයිනේහි පස්සමාකුඩ්ඩි හා පෙනොබ්ස් කොට් යන ඉන්දියානුවෝ ඩොලර් කෝටි 8 ක වන්දියක් ලබා ගත්හ. එම ගෝත්‍රිකයෝ එම මුදලින් කොටසක් වැය කොට වනාන්තර ඉඩම් අක්කර තුන් ලක්ෂයක් මිල දී ගත්හ.

### ආදිවාසීන්, පරිසරය හා සංවර්ධනය


***'වනාන්තර සහ මේ ග්‍රහලෝකය සජීවීව තබා ගැනීමේ දැනුම ඔබගෙන් ගිලිහී ඇති බැවින් එය යළි ඔබට ලබාදීම සඳහා එම දැනුම සුරක්ෂිත කර ගැනීමට මම ප්‍රයත්න දරමි.'***

**කයාපෝ** (බ්‍රසීලය) ඉන්දියානු නායකයෙක්.



මාසයි කාන්තාවක් - කෙන්යා

සිය වගා කටයුතු වල දී සහ විශ්වාසවල දී ආදිවාසී ජනතාව හා ජෛවීයේ සම්පත් මෙන්ම පරිසරය සමග මනා සබැඳියාවක් තිබිණ. ඔවුන්ගේ සම්ප්‍රදායික කෘෂිකාර්මික ක්‍රමවලින් ඉඩම් සංරක්ෂණය සහ ජෛවීය විවිධත්වය ප්‍රවර්ධනය විය. ඔවුන්ගේ ආගමිකපුද පූජාවල දී කැලෑ සහ වෙනත් භූමි ප්‍රදේශ වනජීවින්-දෙවිදේවතාවන් හා භූතයන් සඳහා වන පුදබිම් ලෙස වෙන් කෙරිණ. පියවි ලෝකයේ බොහෝ මිනිසුන් ආධිපත්‍යයක් ලබා ගැනීමට අපේක්ෂා කරන ක්ෂේත්‍රවල ආදිවාසීහු කල්පවතින සංවර්ධනයේ හරය හා ඓතිහාසික ප්‍රවේගය කෙරෙහි පක්ෂපාතීත්වය දක්වති. එම සංවර්ධන ප්‍රවේශයේ ලක්ෂණය වන්නේ අනාගත පරපුරට සිය අවශ්‍යතා සපුරාගැනීමට ඇති හැකියාවට හානි නොවන අයුරින් වත්මන් පරපුරේ අවශ්‍යතා සපුරා ගැනීමයි.



උෂ්ණත්වය වැඩිවීම, වන විනාශය, කාන්තාර ඇති වීම සහ ඕසෝන් ස්ථරයේ විනාශවීම් ආදි අර්බුද අන්තර් ජාතික වශයෙන් ප්‍රධාන ස්ථානයකට පැමිණ ඇති අතර, ආදිවාසීහු මෙහි වෙනත් තත්ත්වයට මුහුණ පා සිටිති. ආදිවාසීහු වරෙක නවීකරණය සමග ක්‍රියා කිරීමට වඩාත් ප්‍රථම ලෙස සලකන ලදහ. අසාධාරණය නිසා ශත වර්ෂ ගණනාවක් පීඩිතයෝ වූහ. ඉඩම් අල්ලා ගැනීමෙන් ඔවුන්ගේ තත්ත්වය තවත් අයහපත් විය. එහෙත් පරිසර කළමනාකරණ යට ඔවුන් දක්වන ලැදියාව හා හැකියාව පිළිගැනීම නිසා ආදිවාසීහු මානව සංහතියේ අනාගත සංවර්ධන ගමන් මාර්ගයන් සැලසුම් කිරීමේ ලෝක ප්‍රයත්නයේ දී ප්‍රධාන නළුවන් ලෙස පිළිගනු ලැබෙති.

1993 ලොව ආදිවාසීන්ගේ අන්තර් ජාතික වසරේ දී විශේෂ අවධානය යොමු කෙරෙන විෂය කීපයකි. කල් පවතින සංවර්ධනයේ දී ආදිවාසීන්ගේ දායකත්වය, කල් පවතින සංවර්ධනය හා ආදිවාසීන් ගේ මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, ඒ අතර ප්‍රධාන තැනක් ගනී. එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් මේ වසර ප්‍රකාශයට පත් කරන ලද්දේ ආදිවාසීන් මුහුණපාන මානව අයිතිවාසිකම්, සංවර්ධනය, පරිසරය, අධ්‍යාපනය, සෞඛ්‍ය වැනි ක්ෂේත්‍රවල ප්‍රශ්න විසඳීම සඳහා අන්තර් ජාතික සහයෝගිතාව තර කිරීමේ අරමුණිනි. මේ වසරේ සම්බන්ධීකරණ නිලධාරියා ලෙස පත්වී සිටින්නේ මානව අයිතිවාසිකම් විෂය භාර උපලේකම්වරයා ය. මේ වසරේ වැඩ කටයුතු සම්බන්ධීකරණය ජිනීවාහි පිහිටි මානව අයිතිවාසිකම් මධ්‍යස්ථානයට පැවරේ.

**මිහිතල සමුළුවේ ආදිවාසීහු**

පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සමුළුවේ දී ආදිවාසීන්ට විශේෂ ස්ථානයක් හිමි විය. මින් පෙර නොවූ විරූ තරම් ලෝක නායක යන් රාජ්‍ය නොවන සංවිධාන, ව්‍යාපාරික විධායකයෝ අධ්‍යාපනඥයෝ, ශිෂ්‍යයෝ ගම් මට්ටමේ කාර්ය යන්හි නිරත වූවෝ එයට සහභාගි වූහ. 1992 බ්‍රසීලයේ රියෝ ඩි ජෙනෙයිරෝහි පැවති සමුළුව මිහිතල සමුළුව නමින් හැඳින්විණ. එයට ආදිවාසීහු කණ්ඩායම් රැසක් ද සහභාගි වූහ. සෙසු අයට සිය අදහස් ප්‍රකාශ කිරීමට එය වේදිකාවක් විය.

රියෝ ද ජෙනෙයිරෝ ප්‍රකාශනයේ 22 වගන්තියේ මෙසේ සඳහන් වේ. **'ආදිවාසීන්ගේ දැනුම හා සම්ප්‍රදායික පර්චය නිසා පරිසර කළමනාකරණයේ දී සහ සංවර්ධනයේ දී ඉටු කිරීමට ඔවුනට වැදගත් කාර්යය භාරයක් පැවරේ. කල් පවතින සංවර්ධන අරමුණ සපුරා ගැනීම සඳහා ආදිවාසීන්ට සපල ලෙස සහභාගි වීමට හැකිවන පරිදි රාජ්‍යයන් නිසි පරිදි ඔවුනගේ අනන්‍යතාව, සංස්කෘතිය හා අභිලාෂ වෙනුවෙන් සහාය දිය යුතුයි.'**

**පරිසර පරිහානියෙන් පීඩිතවූවෝ**

රියෝහි දී ඇති කරගත් ඉලක්ක හා ආදිවාසීන් ගේ ඉරණම අතර මහා පරතරයක් තිබේ. ආණ්ඩු, සංවර්ධන බැංකු, බහු ජාතික සමාගම් සහ ව්‍යවසායකයන් විසින් උසස් පරිභෝජනයකින් යුත් කාර්මික සමාජවල සහ ජනගහණය වැඩි වෙමින් තිබෙන සංවර්ධනය වන රටවල අවශ්‍යතා සපුරාලීමට සම්පත් සොයා යාම නිසා ගත වූ දශක හතර තුළ ආදිවාසීන්ගේ ඉඩම් ඔවුනට අහිමි වී යාම සීඝ්‍රයෙන් සිදු විය. දිගු කලක් ඔවුන්ගේ එම ප්‍රදේශ ඛනිජ නිධි, ජල විදුලි ශක්‍යතාව, උසස් තත්ත්වයේ දැව, තෙල්, ගොවිබිම් සහ තණ බිම් වලට ලෙහෙසියෙන් ප්‍රවේශ විය නොහැකිව තිබු නමුත්, නව තාක්ෂණය නිසා එය පහසු වී ඇත. දීර්ඝ කාලයක් ආදිවාසීන්ට හිමිව තිබූ ඉඩම් භුක්තියට දැන් ඇත්තේ මද ආරක්ෂාවකි. ආකරකරුවන් යොදා ගත් රසදියවලින් ඇමසන් ගංගා පද්ධතියේ කිලෝ මීටර් 1500 ක් පමණ විෂ මුසු තත්ත්වයට පත්වී ඇත. පතල්කරුවන් නව ලෙඩ රෝග ගෙනවිත් තිබේ. බ්‍රසීලයේ යනෝමාමි ඉන්දියානුවන් රැසක් ඔවුන් ගේ ප්‍රතිශක්තියට ඔරොත්තු නොදෙන නව රෝගවලින් මිය ගොස් ඇත. ඉක්වදෝරයේ වසර ගණනාවක සිට තෙල් ගවේෂණ හා කැනීම් නිසා එරට ඉන්දියානුවනට අහිතකර අයුරින් පරිසරයට හානි සිදු වී ඇත.

විෂ ද්‍රව්‍ය ජලයට මුසුවීම ද ප්‍රශ්නයකි. කැනඩාවේ ශාන්ත ලෝරන්ස් ගංගාවට වාර්ෂිකව උපද්‍රව කාරක අපද්‍රව්‍ය ගැලුම් පනස් ලක්ෂයක් දැමේ. මොහක් ඉන්දියානුවන් සහ ආදිවාසීන් නොවන විශාල ජන සංඛ්‍යාවක් පානීය ජලය ලබා ගැනීමට හා ධීවර කටයුතුවල දී මේ ගංගාව යොදා ගනී. සමුද්‍රයට - තෙත්බිම්වලට හා වෙරළ ප්‍රදේශවලට අපද්‍රව්‍ය දැමීම නිසා ආදිවාසීන්ගේ බොහෝ මත්ස්‍ය බිම් අහිමි වී ඇත. අම්ල වර්ෂා නිසා උතුරු ඇමරිකාවේ, උතුරු යුරෝපයේ සහ විශේෂයෙන් ස්කැන්ඩිනේවියාවේ වැව් දහස් ගණනක් හා වනාන්තර විනාශ වී තිබේ. සාමි සහ වෙනත් ආදිවාසීහු එහි වෙසෙති. න්‍යෂ්ටික අත්හදා බැලීම් නිසා පැසිපික් දූපත්වාසීන්ට දරාගත නොහැකි තරම් විකිරණ එම ප්‍රදේශවල ඇත.

මේ අතරින් ආදිවාසීන්ට මහත් ව්‍යසනයක් ගෙන දෙන ඔවුන්ගේ ජීවිකාවට හා සමාජ සංස්ථාවට මෙන් ම පැවැත්මට හානිකර දෙය



වන්නේ දැනට ලෝකයේ සිදුවන නිවර්තන වැසි වනාන්තර විනාශයයි. මේවා ආශ්‍රිතව ආදිවාසීහු කෝටි පනහක් පමණ ජීවත් වෙති. අපනයනයෙන් ලාභ ලැබීමට දැව නිපදවීමටත්, අලුත් කෙත්බිම් අස්වැද්දීමටත් වනාන්තර විනාශ කෙරේ.

ජලගැලීම්, ජෛවීය විවිධත්වය විනාශවීම, කාන්තාරකරණය පූජනීය පෙදෙස් විනාශය, දඩයම් හා ධීවර වැනි සාම්ප්‍රදායික ආර්ථික කටයුතු අවුල් වී යාම, මිනිසුන් බලහත්කාරයෙන් වෙනත් ස්ථානවල පදිංචි කිරීම මේවායේ ප්‍රතිඵලයි.

දරිද්‍රතාව-මානසික සාංකාව, මත්පැන්, දුරාචාර සහ දිවිනසා ගැනීම් ආදිය වැඩිවීම ද, අතුරු ප්‍රතිඵල වේ. වන විනාශය දැන් මට්ටමින් සිදුවුවහොත් මැලේසියාවේ කෙන්යා සහ ඔරන්ජ් උළු ජනතාව ජීවත්වන නවක වනාන්තර ඉදිරි දශකය තුළ අහිමි වේ. ඉන්දුනීසියාව-ඉන්දියාව-නේපාලය යන රටවල සහ අප්‍රිකාවේ සහ දකුණු ඇමරිකාවේ ආදිවාසීන්ට ද එසේමය. වේලි ඉදි කිරීම හා වාර්මාර්ග ව්‍යාපෘති වැනි සංවර්ධන වැඩ සටහන්වලින් එවැනි තත්ත්ව උදාවෙයි. පාරිසරික පරිහානියේ පෙරමුණට ආදිවාසීන් පැමිණීමට හේතුවන ප්‍රධාන කරුණක් වන්නේ ඔවුන් ලෝකයේ ඉතාමත් වටිනා ඇතැම් ඉඩම්වල පදිංචිව සිටීමයි. ඕස්ට්‍රේලියාවේ වටිනා ඛනිජවලින් වැඩි ප්‍රමාණයක් ඇබෝරිජිනල් වරුන් වසන ප්‍රදේශවල ඇත. කොලොම්බියාවේ ගුවාජිරෝවරුන් වාසය කරන්නේ ලෝකයේ ප්‍රයෝජනයට නොගත් විශාලම ගල්අඟුරු නිධියක් ඇති ප්‍රදේශයකයි. ආසියාවේ විශාලතම යපස් පතල පිහිටා ඇත්තේ ඩන්ඩාම්වරුන් වාසය කරන ප්‍රදේශයේ ය. නවත් හේතුවක් වන්නේ ආදි වාසීන් සිටිනුයේ ලෝකයේ ඉතාමත් හානියට පත්විය හැකි ජීව පරිසර ප්‍රදේශවන නිවර්තන වැසි වනාන්තර, ආර්ටික් වෙරළ කලාප හා කඳු ආශ්‍රිත ප්‍රදේශවලයි. සීඝ්‍ර වනාන්තර විනාශයෙන්, කාබන්ඩයොක්සයිඩ් උරාගෙන ලෝකයේ උණුසුම මධ්‍යස්ථ තත්ත්වයට පත් කිරීමට ඇති හැකියාව අඩු වෙයි. එනිසා වනාන්තරව සහ ආදිවාසීන්ගේ වෙනත් වාසභූමි ප්‍රදේශ රැක ගැනීම සැමගේ යහපත සඳහා වෙයි.

**මානව අයිතිවාසිකම් සබඳතා**

පරිසර පරිහානියේ හෝ අනුචිත සංවර්ධනයේ පීඩිතයන් වශයෙන් ආදිවාසීහු තම මානව අයිති වාසිකම් හා මූලික නිදහස නොසලකා හැරීම හෝ උල්ලංඝනය කිරීමක් හැමවිටම සිදුවන බව සලකති. සංවර්ධන සැලසුම් සැකසීමේ ක්‍රියාවලියේ දී ආදිවාසීන් ගේ අදහස් සැලකිල්ලට නොගැනේ. ඔවුන්ගේ ඉඩම් හෝ සම්පත් ප්‍රයෝජනයට ගැනීම වෙනුවෙන් .වන්දි ගෙවීමක් සිදු නොකෙරේ. බොහෝ රටවල පාරිසරික වශයෙන් ඵලදායි නොවන ක්‍රියා කලාප සඳහා නෛතික රැකවරණ අවම හෝ නැති තත්ත්වයක් පවතී. සංවර්ධනයට ආර්ථික-සාමාජීය-සංස්කෘතික, දේශපාලන සහ සිවිල් අයිතිවාසිකම් එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයේ සහ අන්තර් ජාතික මානව අයිතිවාසිකම් පිළිබඳ සම්මුතිවල විස්තර කෙරෙන පරිදි භුක්ති විඳීමට ආදිවාසීන්ට නොලැබෙයි. එනිසා ආදිවාසීන් ඔවුන්ගේ දෘෂ්ඨිය හා සංවිධානාත්මක දක්ෂතා අනුව මෑත කාලයේ දී සැලකිය යුතු ප්‍රගතියක් පෙන්වා ඇතත්, බොහෝ අංශවලින් සහ වෙනස්වීම් පිළිබඳව දැඩි අසතුටකින් පසුවන බව පෙනේ. ඔවුන්ගේ නියෝජිතයෝ රියෝ සමුළුවේ දී බොහෝ දේ ප්‍රකාශ කළ හ. ආදිවාසීන් පිළිබඳ රියෝ ප්‍රකාශය නිකුත් කෙරිණ. **'සාම්ප්‍රදායික මිනිසුන්ගේ හඬ නොඇසේ'** යනුවෙන් එහි සඳහන් වේ.



*වැදි මවක් සහ දරුවෙක්. චිත්‍ර ශිල්පී ජී. ඇස්. ප්‍රනාන්දු මහතාගේ චිත්‍රයක් ඇසුරිණි.*



### ආදර්ශමත් සංරක්ෂකයෝ

සංකීර්ණ ජීව පරිසර පද්ධතිය කළමනාකරණයේ දී අන්තර් ජාතික ප්‍රජාවට ආදිවාසීන්ගේ සාම්ප්‍රදායික දක්ෂතාවලින් බොහෝ දේ ඉගෙන ගත හැකි බව පරිසරය හා සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ ලෝක කොමිසම 1987 දී ප්‍රකාශ කළේ ය. සොබා දහම සමග සුසැදියාවෙන්, හැමවිටම කල් ගෙවන, ආදිවාසීන්ට සවන් දී ඔවුන්ගෙන් ඉගෙන ගන්නා ලෙස සිය රටවැසියනට නොබෝ දා ප්‍රකාශ කර සිටි එක් රාජ්‍ය නායකයෙක් ඔවුන් අනුගමනය කරන සංවර්ධන ආකෘතිය අනුගමනය කිරීමට තම රට බලාපොරොත්තු වන බව කීවේ ය.

ඉඩම් පරිහරණය හා සම්පත් කළමනාකරණය, වගා මාරුව, විවිධ කෘෂි වන වගා, හෙල්මළු කෘෂි කර්මය දඩයම් හා ධීවර කටයුතු සඳහා ආදිවාසීන් සාර්ථක ක්‍රම දියුණු කොට තිබේ. පැලෑටිසාර බෙහෙත්, පස, ශාක, සතුන් හා දේශගුණය පිළිබඳ පුළුල් දැනුමක් ඔවුන් සතුව ඇත. උදාහරණයක් වශයෙන් බ්‍රසීලයේ කයාපෝවරුන් බීජ තේරීම, වගා මාරුව ආදි සියුම් වගා ක්‍රම යොදා ගනිති. පිලිපීනයේ හනුනෝවරු ස්වකීය වනාන්තරවල පැලෑටි වර්ග 1600 ක් වෙන් කොට හඳුනාගෙන ඇත. 400 කට වැඩි විද්‍යාඥයෝ එම ප්‍රදේශවල සේවය කරති. බොහෝ ආදිවාසීහුනමන්ලොව වඩාත් පළපුරුදු පරිසරවේදීන් වශයෙන් ප්‍රකාශ කර ගනිති.

### ආදිවාසීන්ගේ අයිතීන් පිළිබඳ විශ්ව ප්‍රකාශනයක් කරා

ආදිවාසී ජනතාව පිළිබඳ එක්සත් ජාතීන්ගේ කාරක කණ්ඩායම 1985 සිට ආදිවාසීන්ගේ අයිති වාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය කෙටුම්පත් කරමින් සිටිති. ස්වකීය අභ්‍යන්තර හෝ ප්‍රාදේශීය කටයුතු පිළිබඳ සම රාජ්‍යයක් හෝ ස්වයං පාලනයක්, වාර්ගික හෝ සංස්කෘතික අනන්‍යතා සංරක්ෂණය හා සංවර්ධන, ආගම් භාෂා හා අධ්‍යාපනික ආයතන පිළිබඳ අයිතීන්ට අදාළ කරුණු මේ කෙටුම් පතින් ආවරණය වෙයි.

ඉඩම්-සම්පත්, පරිසර සංරක්ෂණය හා සංවර්ධනය පිළිබඳ ගැටළු යෝජිත ප්‍රකාශනයේ සඳහන් වෙයි. ආදිවාසීන්ට ඇති අයිතීන් පිළිබඳව කෙටුම්පතින්:

* ඉඩම්-භූමි ප්‍රදේශ පාරම්පරිකව ජීවත් වූ හෝ වෙනත් ආකාරයකින් ප්‍රයෝජනයට ගත් සම්පත් සමග ඇති සුවිශේෂ හා පුළුල් සබඳතාව පිළිගැනීම.
* මුළු පරිසරය හා ඔවුන්ගේ ඉඩම් හා භූමි ප්‍රදේශවල ඵලදායිතා ධාරිතාව ආරක්ෂා කිරීම හා පුනරුත්ථාපනය.
* දඩයම ධීවර කර්මාන්ත, සත්ව පාලනය, එක් රැස් කිරීම හා වගාව ඇතුළු ඔවුන්ගේ සාම්ප්‍රදායික හා වෙනත් ආර්ථික කටයුතු වල නිදහසේ නිරතවීම තහවුරු කෙරේ.

කෙටුම්පත් ප්‍රකාශනය අන්තර් ජාතික වසර අවසන් වනවිට සම්පූර්ණ කිරීම කණ්ඩායමේ බලාපොරොත්තුවයි.

### රියෝ සිට

පාරිසරික ගැටළු පිළිබඳව කල් තබා අනතුරු හැඟවීමේ හැකියාව ආදිවාසීන් සතුව ඇති බව සැලකේ. 'මිහිතල මාතාව' ඔවුන්ගේ සංස්කෘතියේ හරයයි. දෛනික, භෞතික අවශ්‍යතා මෙන් ම අධ්‍යාත්මික පැවැත්මත් එයින් සැපයේ. දූෂණ කාරක හා ඔවුන් අවට තත්කාලීන සමාජවල කල් නොපවතින සුළු පරිචයක් පවතින ක්‍රමය ආක්‍රමණය කළ විට ප්‍රථමයෙන් හානි සිදුවන්නේ අතර ආදිවාසීහු වෙති.

ස්වකීය ජීවිතය හා සොබාදහම සම්බන්ධයෙන් පවතින සබඳතාව ගැන ලොවට ප්‍රකාශ කිරීමට ආදිවාසීන් සතු පණිවුඩයක් ඇතැයි විලී විශේෂඥ මාරියෝ ඉවර්රා කියයි. ඔවුන්ගේ සංවර්ධන සංකල්පය එකිනෙකාගේ සංවර්ධන සංකල්පයට එරෙහිය. එය ඉක්මවා යයි. **ඉඩම් විරලය. එය සූරාකෑමේ භාණ්ඩයක් නොවේ. ඉඩම් සැමගේ පැවැත්මේ පදනමයි. අනාගත පරපුර සඳහා ඉඩම් සංරක්ෂණය කළ යුතුයි.' එය ඔවුන්ගේ පණිවුඩයයි."**

### එසේ නම් කුමක් කරමු ද?

තම අයිතීන් විශේෂයෙන් ඉඩම් හා සම්පත් පිළිබඳ ගැටළුවලටඅදාළ විධි විධාන බොහෝ රාජ්‍යවල ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවලට හා සෙසු ව්‍යවස්ථාදායකවලට යොමු කෙරෙන විට ආදිවාසීන් සතුටට පත් වී ඇත. ඇතැම් රටවල ස්වයං පාලන ගිවිසුම්, වෙනත් සහයෝගීතා ගිවිසුම්, ආණ්ඩු සහ ආදිවාසීන් අතර ඇති වෙමින් තිබේ. සංවර්ධන ව්‍යාපෘති වල තීරණ ගැනීමේ දී ආදිවාසීන්ගේ අවශ්‍යතා පිළිබඳව වඩාත් සංවේදීවීමට ලෝක බැංකුව වැනි අන්තර් ජාතික ණය දෙන ආයතන ප්‍රතිඥා දී තිබේ. වැඩසටහනේ අඩංගු ක්‍රියාකාරී වැඩසටහනේ ප්‍රතිඥාවලට රාජ්‍යයන් ගරු කොට ක්‍රියා කරනු ඇතැයි ආදිවාසීහු බලාපොරොත්තු වෙති. කල් පවතින



සංවර්ධනය පිළිබඳ කොමිසමක් පත් කිරීමට එම වැඩ සැලැස්මෙන් යෝජනා කෙරුණු අතර, එහි කිසියම් කාර්ය භාරයක් ආදිවාසීහු බලාපොරොත්තු වෙති. මානව අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ කොමිසම ලොව මානව අයිතිවාසිකම් වලට ගරු කිරීම් පිළිබඳ සොයා බලන්නාක් මෙන් රියෝ සමුළුවේ දී දුන් ප්‍රතිඥා ඉටු කිරීමට රාජ්‍යයන් ක්‍රියා කිරීම ගැන සොයා බැලීමට මේ කොමිසමට බලය පැවරිය යුතු යැයි යෝජනා කෙරේ. 47 වැනි සැසිවාරයේ දී මේ යෝජනාව සලකා බැලීමට මහා මණ්ඩලය බලාපොරොත්තු වේ.

වෙනත් අරමුණු ඉටු කර ගැනීම සඳහා ක්‍රියා කිරීමට මේ වසර ප්‍රකාශයට පත් කිරීම නිසා ආදිවාසීන්ට අවස්ථාව උදාවී තිබේ. ආදිවාසීන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන ප්‍රධාන අන්තර් ජාතික නීතිමය බලය ඇති ලෝක කම්කරු සංවිධානයේ 169 සම්මුතිය පුළුල් පිළිගැනීමට ලක් කිරීම, ආදිවාසීන්ගේ අන්තර් ජාතික වසර සඳහා වන ස්වේච්ඡා අරමුදලට ආණ්ඩු, එක්සත් ජාතීන් සහ රාජ්‍ය නොවන සංවිධාන වල වැඩි සහාය ලබා ගැනීම, ලතින් ඇමරිකානු හා කැරිබියානු ආදිවාසීන් සඳහා වන සංවර්ධන අරමුදලට පුළුල් ලෙස ලෝක ආධාර ලබා ගැනීම සහ ආසියා අප්‍රිකා ශාන්තිකර හා වෙනත් කලාප වෙනුවෙන් ද මේ හා සමාන අරමුදල් පිහිටුවා ගැනීමට ක්‍රියා කිරීමට දැන් ඔවුන්ට අවස්ථාව තිබේ.

ආදිවාසීන් රැක ගැනීම ඔවුන්ගේ ඉඩම් හා ස්වභාවික සම්පත් අතර වෙන් කළ නොහැකි සබඳතාව මත රඳා පවතී. ගරුත්වයෙන් යුතුව හා ස්වයං පෝෂිතව කල් ගෙවීමට ආදිවාසීන් සටන් කරන අතර, තමන් විශේෂ උනන්දුවක් දක්වන ගැටළු විසඳා ගෙන සහනයක් සලසා ගැනීමට ද ඔවුහු බලාපොරොත්තු වෙති. පොදු පදනමක් සකසා ගැනීමට රාජ්‍යවලට හා ආදිවාසීන්ට හොඳ අවස්ථාවක් සලසා දෙන්නේ පාරිසරික ගැටළු වලිනි.

**(එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් ආදිවාසීන්ගේ වසර වෙනුවෙන් නිකුත් කරන ලද පත්‍රිකාවක් ඇසුරෙනි.)**


---

## ආදිවාසීන් පිළිබඳ අන්තර් ජාතික වසරේ අරමුණ කුමක් ද?

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් 1993 ආදිවාසීන්ගේ වසර ලෙස ප්‍රකාශයට පත් කරන ලද්දේ මානව අයිතීන්, පරිසරය, සංවර්ධන, අධ්‍යාපනය හා සෞඛ්‍ය වැනි ක්ෂේත්‍රවල දී ආදිවාසීන් මුහුණපාන ගැටළු විසඳීමේ ක්‍රියාවලියේ දී අන්තර් ජාතික සහයෝගිතාව ශක්තිමත් කිරීම සඳහා ය.

මේ වර්ෂය ප්‍රකාශයට පත් කරන ලෙස ඉල්ලා සිටින ලද්දේ ආදිවාසීන්ගේ සංවිධාන විසිනි. මෙය ඔවුන් 21 වැනි ශත වර්ෂයට ස්වකීය සංස්කෘතික ඒකාග්‍රතාව හා තත්ත්වය සම්බන්ධ කිරීමට දැරූ අරගලයේ ප්‍රතිඵලයයි. මේ සැමට වඩා ඉන් අදහස් කෙරුණේ රාජ්‍ය හා ආදිවාසීන් අතරත් නව සබඳතාවක් ඇති කිරීමයි. එය අන්‍යෝන්‍ය ගරුත්වය හා විශ්වාසය මත පදනම් වූ නව සබඳතාවකි.

එක්සත් ජාතීන්ගේ මහලේකම්වරයා විසින් ලෝකයේ ආදිවාසීන් සඳහා වූ අන්තර් ජාතික වසර වෙනුවෙන් ස්වේච්ඡා අරමුදලක් පිහිටුවා ඇති අතර, ඊට දායක මුදල් සපයන්නැයි ආණ්ඩු වලින් ඉල්ලා සිටී. මේ වසරේ වැඩසටහන් හා ක්‍රියාකාරකම්වලට ද අධ්‍යාපනික හා සංස්කෘතික වැඩ සටහන්වලට ද එමගින් ආධාර කෙරෙයි.



## ආදිවාසීන් පිළිබඳව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ කාර්ය භාරය

එක්සත් ජාතීන්ගේ පද්ධතිය තුළ ආදිවාසී අයිතිවාසිකම් සඳහා ක්‍රියා කාරී මධ්‍යස්ථානය වන්නේ ආදිවාසීන් සඳහා වන එක්සත් ජාතීන්ගේ කාර්ය කණ්ඩායමයි. එම කණ්ඩායම:

* ★ ආදිවාසීන්ගේ මානව අයිතිවාසිකම් සුරකින ආණ්ඩු ප්‍රතිපත්ති සමාලෝචනය කරයි.

* ★ අසාධාරණකම් හා වෙනස්කම් පිටුදැකීමේ හා සුළු ජාතීන් ආරක්ෂා කිරීමේ එක්සත් ජාතීන්ගේ උප කොමිසමට සහ ආදි වාසීන්ට සම්බන්ධ ගැටළු පිළිබඳ කාර්යයන් ප්‍රවර්ධනය කරන එක්සත් ජාතීන්ගේ මානව අයිතිවාසිකම් කොමිසමට නිර්දේශ ඉදිරිපත් කරයි.

* ★ ආදිවාසීන්ගේ අයිතිවාසිකම් පිළිබඳ ප්‍රඥප්තියක් කෙටුම්පත් කරයි. එය මේ වසරේ දී නිම කෙරේ.

* ★ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්වල දී ආදිවාසීන්ගේ සංවිධානය ඊට එරෙහිව එක්සත් ජාතීන්ගේ පැමිණිලි පටිපාටිය ප්‍රයෝජනයට ගැනීම වැඩිවෙමින් පවතී.

ආදිවාසීන්ගේ කණ්ඩායම්වල අයිතිවාසිකම් ප්‍රවර්ධනයට පියවර තැබූ ප්‍රථම අන්තර් ජාතික සංවිධානය වන්නේ අන්තර් ජාතික කම්කරු සංවිධානයයි. ආදිවාසී හා ගෝත්‍රික ජනතාව පිළිබඳ අන්තර් ජාතික කම්කරු සංවිධානයේ 169 වැනි සම්මුතියෙන් ආදි වාසීන්ගේ අනන්‍යතාව පිළිබඳව ඔවුන් කියාපාන හිමිකම නැති කිරීමට කිසිම රාජ්‍යයකට හෝ සාමාජයීය කණ්ඩායමකට අයිති යක් නැති බව සනාථ කෙරේ. එසේම ආදිවාසීන්ගේ සහභාගිත්වය ඇතිව, ඔවුන්ගේ අයිතිවාසිකම් හා ඒකාග්‍රතාව සහතික කිරීමේ වගකීම එම සම්මුතිය අනුව පැවරෙන්නේ රාජ්‍යයටයි. තාක්ෂණික ආධාර වැඩසටහන් ගණනාවක් අන්තර් ජාතික කම්කරු සංවිධානය දියත් කොට ඇත.





සොබා